සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# අවසාන වාර පරීක්ෂණය 2016

**10 ශ්‍රේණිය** **පුරවැසි අධ්‍යාපනය I** **කාලය පැය 01 යි.**

| නම/ විභාග අංකයඃ |
|---|

<u>උපදෙස් :</u>

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.
- පිළිතුරු සැපයීමේ දී නිවැරදි පිළිතුර හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න. (ඔබට බහුවරණ කඩදාසියක් සැපයේ.)

01. "ප්‍රජාතන්ත්‍රවාදය", ජීවන ක්‍රමයක් ලෙස වැදගත් වන්නේ,

(1) අයිතිවාසිකම් ගැන කියාදෙන නිසාය. (2) යුතුකම් ගැන කියාදෙන නිසාය.

(3) අයිතිවාසිකම් හා යුතුකම් ගැන කියාදෙන නිසාය. (4) අයිතිවාසිකම් නොඉවසන නිසාය.

02. ඍජු ප්‍රජාතන්ත්‍රවාදයේ නිජබිම ලෙස සැලකෙන රට වන්නේ,

(1) ග්‍රීසිය (2) රෝමය (3) බ්‍රිතාන්‍යය (4) ප්‍රංශය

03. තරඟකාරී පක්ෂ ක්‍රමයක යහපත් ලක්ෂණයක් වන්නේ,

(1) අත්තනෝමතික පාලකයන් බිහි කිරීමයි. (2) බහුවිධතාව තුළින් එක්සත් බව ගොඩනැගීමයි.

(3) ජනමතය නියෝජනයට අවු ඉඩක් ලබා දීමයි. (4) විවිධත්වයට ගරු නොකිරීමයි.

04. නිදහස් හා සාධාරණ මැතිවරණයක් පැවැත්වීමේ දී,

(1) නියමිත කාල සීමාවේ දී පැවැත්විය යුතුය.

(2) ප්‍රජා අයිතිය නැති අයට පවා ඡන්දය දීමට ඉඩ ලබාදිය යුතුය.

(3) නියෝජිතයන්ගේ කැමැත්ත අනුව ඡන්දය ප්‍රකාශ කළ යුතුය.

(4) යුධකාමී වාතාවරණයක් තුළ වුව ද ඡන්දය පැවැත්විය යුතුය.

05. විරුද්ධ පක්ෂයේ කාර්යභාරයක් වන්නේ මින් කුමක් ද?

(1) ආණ්ඩු පක්ෂයට සහයෝගය ලබා දීම.

(2) ආණ්ඩු පක්ෂය විවේචනය කිරීම.

(3) ආණ්ඩු පක්ෂයට සංවර්ධනාත්මක විවේචන ඉදිරිපත් කිරීම.

(4) ආණ්ඩුව සිදු කරන සියලු ක්‍රියා අනුමත කිරීම.

06. පුරවැසියා කෙරෙහි රජයේ වගකීමක් වන්නේ මින් කුමක් ද?

(1) නීතිය අතට ගෙන ක්‍රියා කිරීම. (2) රටේ සම්පත් සියල්ල සාධාරණව බෙදීම.

(3) රාජ්‍ය මූල්‍ය අවභාවිතා කිරීම. (4) පරිසරය ආරක්ෂා කිරීමට යොමු වීම.

07. පහත කරුණුවලින් පාර්ලිමේන්තු ආණ්ඩු ක්‍රමයට අදාළ කරුණු වන්නේ,

A ව්‍යවස්ථාදායකය හා විධායකය අතර දුරස්ථ සම්බන්ධය.

B ව්‍යවස්ථාදායකය තුළින් විධායකය උපත ලැබීම.

C විධායකය ව්‍යවස්ථාදායකයට සාමූහිකව වගකීම.

D විධායකය පහසුවෙන් ඉවත් කිරීමට ව්‍යවස්ථාදායකයට නොහැකි වීම.

(1) A, B (2) B, C (3) C, D (4) B, D

08. ඒකීය රාජ්‍යයක දැකිය හැකි ලක්ෂණයක් වන්නේ,

(1) මධ්‍යම ආණ්ඩුව සතු ව්‍යවස්ථාදායක, විධායක, අධිකරණ බලතල එක් මධ්‍යම ආණ්ඩුවකින් පමණක් ක්‍රියාවට නැංවීම.

(2) මධ්‍යම ආණ්ඩුව සතු ව්‍යවස්ථාදායක, විධායක, අධිකරණ බලතල මධ්‍යම ආණ්ඩුවලින් හා ප්‍රාන්ත ආණ්ඩුවලින් ක්‍රියාවට නැංවීම.

(3) මධ්‍යම ආණ්ඩුව සතු ව්‍යවස්ථාදායක, විධායක, අධිකරණ බලතල ප්‍රාදේශීය පාලන ඒකක වෙත පවරා දීම.

(4) ප්‍රාදේශීය පාලන ඒකක ශක්තිමත් භාවයෙන් යුතු වීම.

09. සන්ධීය රාජ්‍යයක නව ප්‍රවණතාවක් වන්නේ,

(1) සාමාන්‍ය නීති සම්පාදනයේ දී ප්‍රාන්තවල කැමැත්ත සළකා බැලීම.

(2) මධ්‍යම ආණ්ඩු හා ප්‍රාන්තවල මූල්‍යමය ගනුදෙනු සමසේ සිදු කිරීම.

(3) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අර්ථ නිරූපණය කිරීමේ දී මධ්‍යම ආණ්ඩුවට වාසි වන ලෙස එය සිදු කිරීම.

(4) රාජ්‍ය සුභසාධන කාර්යයන් මධ්‍යම ආණ්ඩුව හා ප්‍රාන්ත රාජ්‍ය සමසේ දැරීම.

10. "බාහිර සාධකයන්ගෙන් තොරව පුද්ගලයාට සිය පෞද්ගලිකත්වය වර්ධනය කර ගැනීමට ඇති ඉඩ ප්‍රස්ථාව නිදහසයි". එසේ ප්‍රකාශ කළේ මින් කවර පුද්ගලයා ද?

(1) මහාචාර්ය ගානර් (2) ඇරිස්ටෝටල් (3) ඒබ්‍රහම් ලින්කන් (4) ඩී. ජී. එච්. කෝල්

11. සන්ධීය ආණ්ඩු ක්‍රමයක් පවතින රටවලට උදාහරණයක් දැක්වෙන්නේ කවර පිළිතුරේ ද?

(1) ස්විස්ටර්ලන්තය හා බ්‍රිතාන්‍යය. (2) ඇමෙරිකාව හා ඕස්ට්‍රේලියාව.

(3) ඇමෙරිකාව හා බ්‍රිතාන්‍යය. (4) ඕස්ට්‍රේලියාව හා ලංකාව.

12. බ්‍රිතාන්‍ය පාලන සමය තුල ශ්‍රී ලංකාවේ බලය විමධ්‍යගත කර තිබූ බවට නිදසුන් වන්නේ,

(1) 1865 මහ නගර සභා ආඥා පනත සම්මත කර ගැනීමයි. (2) 1870 ගම්සභා ක්‍රමය ස්ථාපිත කිරීමයි.

(3) 1943 නගරසභා පිහිටුවීමයි. (4) 1947 පළාත් පාලන ආඥා පනත සම්මත කිරීමයි.

13. ශ්‍රී ලංකාවේ ප්‍රථමයෙන් බිහිකළ මහ නගර සභා වන්නේ මින් කවර ඒවා ද?

(1) කුරුණෑගල හා මහනුවර (2) මහනුවර හා කොළඹ

(3) කොළඹ හා මාතර (4) කරුණෑගල හා කොළඹ

14. ශ්‍රී ලංකාවේ මැතිවරණ දිස්ත්‍රික්ක සංඛ්‍යාව වන්නේ,

(1) 23 කි. (2) 24 කි. (3) 22 කි. (4) 25 කි.

15. පළාත් ආණ්ඩුකාරවරයා සතු බලතලයක් වන්නේ,

(1) පළාත් අයවැය ලේඛනය සකස් කිරීම. (2) පළාත් සභාව ඇමතීම හා සන්දේශ යැවීම.

(3) පළාතේ සංවර්ධන සැළැස්ම සකස් කිරීම. (4) පළාතේ ආර්ථික සැලසුම් සකස් කිරීම.

16. ඇමරිකා එක්සත් ජනපදය තුළ ප්‍රධාන විධායක බලය ක්‍රියාවට නංවන්නේ,

(1) අගමැති ප්‍රමුඛ කැබිනට් මණ්ඩලයයි. (2) විධායක ජනාධිපතිවරයාය.

(3) කොංග්‍රස් මණ්ඩලයයි. (4) උප ජනාධිපතිවරයායි.

17. ඇමරිකා එක්සත් ජනපදයේ මධ්‍යම ආණ්ඩුව සතු බලතලයක් වන්නේ මින් කුමක් ද?

(1) නිවාස ඉදිකිරිම. (2) මහාමාර්ග ඉදිකිරීම.

(3) අධ්‍යාපන කටයුතු (4) බදු පැනවීම හා එක්රැස් කිරීම.

18. රටක විධායකයේ ප්‍රධානම කාර්ය වන්නේ මින් කුමක් ද?

(1) නීති සම්පාදනය කිරීම. (2) මුදල් පාලනය.

(3) විධායකය පාලනය. (4) නීති ක්‍රියාවට නැංවීම.

19. වර්තමානයේ යහපාලනය පිළිබඳව දැඩිව සාකච්ඡා කිරීමට හේතුව මින් කුමක් ද?

(1) බලය මධ්‍යගත වීම. (2) පෞද්ගලික අංශය ප්‍රමුඛවීම.

(3) නිලධාරිවාදය ඉස්මතු වීම. (4) රාජ්‍ය පාලකයන් වගකීම් සහිත වීම.

20. යහපාලනයක දැකිය හැකි ගුණාංගයක් වන්නේ,

(1) අනවශ්‍ය ලෙස බලය මධ්‍යගත වීම.　(2) අල්ලස හා දූෂණය ඉහළයාම.

(3) රාජ්‍ය පාලනය අකාර්යක්ෂම වීම.　(4) විනිවිද භාවයෙන් යුක්තවීම.

21. පරිවර්තන ආර්ථිකයක ලක්ෂණයක් වන්නේ මින් කුමක් ද?

(1) රාජ්‍ය ව්‍යවසායන් දිරි ගැන්වීම.

(2) පෞද්ගලික ව්‍යවසායකයන් දිරිගැන්වීම.

(3) ආර්ථික කටයුතු වලට රජය උපරිම ලෙස මැදිහත් වීම.

(4) මිළ පාලන නීති ඇති කිරීම.

22. ලංකාවේ 1977 න් පසු විවෘත ආර්ථික ප්‍රතිපත්තිය යටතේ පෞද්ගලික ව්‍යවසායකයන් දිරිගැන්වීමට පැවති රාජ්‍යයන් විසින් සිදුකළ කාර්යයක් වන්නේ මින් කුමක් ද?

(1) පෞද්ගලික ආයෝජකයන් ට තීරුබදු පැනවීම.

(2) වෙළඳ බාධා නැති කිරීම.

(3) රාජ්‍ය දේපල පෞද්ගලිකරණය කිරීම.

(4) වෙළඳපලට රජයේ මැදිහත් වීම අහෝසි කිරීම.

23. ලංකාවේ දක්නට ඇති වෙළෙඳපොළ ආර්ථික ක්‍රමය,

(1) රාජ්‍ය අංශය දිරි ගැන්වීමේ ක්‍රියාමාර්ග දියත් කරන ලදී

(2) රාජ්‍ය විනිමය පාලනයට මැදිහත් වීම් සිදු කරන ලදී.

(3) රාජ්‍ය ව්‍යවසායක කටයුතු සිදු කරන ලදී.

(4) විදේශ වෙළෙඳාමට සම්බන්ධ බාධා ලිහිල් කරන ලදී.

24. තිරසාර සංවර්ධනයේ දී සැළකිය යුතු වන්නේ මින් කුමක් ද?

(1) මූලික අවශ්‍යතා පමණක් තෘප්තිමත් කර ගැනීම.

(2) අනාගත පරම්පරාව සමග ඒකමතික නොවීම.

(3) සමාජ සුරක්ෂිතතාව ඇති කිරීම.

(4) ජනගහන වර්ධනය වැඩි කර ගැනීම.

25. ලිබරල් වෙළෙඳපොළ ආර්ථිකයක ලක්ෂණයක් වන්නේ,

(1) රාජ්‍ය ව්‍යවසායක් දක්නට ලැබීම.　(2) දේශීය පෞද්ගලික ආයෝජකයන් පමණක් දිරි ගැන්වීම.

(3) පොදු දේපළ අයිතියට ප්‍රමුඛත්වය දීම.　(4) පාලන නීති රීති සීමා අවම කිරීම.

26. දකුණු ආසියානු වරණාත්මක වෙළෙඳ ගිවිසුමට (SAPTA) අයත් සාමාජික රටක් වන්නේ මින් කුමක් ද?

(1) කැනඩාව　(2) මෙක්සිකෝව　(3) නේපාලය　(4) ජර්මනිය

27. මනසේ සාමය ඇති කර ගැනීම සඳහා යොමු විය යුතු අංශයක් වන්නේ,

(1) ස්වභාවික පරිසරය නිරීක්ෂණය කිරීම.　(2) සියලුදෙනා සමඟම මිත්‍රශීලීව සිටීම.

(3) යහපත් ගුණාංග ප්‍රගුණ කිරීම.　(4) සියලුදෙනාට ම සමානව සැළකීම.

28. සාකච්ඡා ක්‍රමයේ ගති ලක්ෂණයක් වන්නේ,

(1) වියදම් අධික වීම .　(2) විධිමත් ව්‍යුහයකින් යුක්ත වීම.

(3) එක් පාර්ශවයකට ජය හිමි වීම.　(4) ක්ෂණික විසඳුම් ලැබීම.

29. " විනිසීමේ" ක්‍රියාවලියක් ක්‍රියාත්මක වීමේ දී,

(1) දෙපාර්ශවයට ම සාකච්ඡාවෙන් ඉවත්විය හැක.

(2) නඩුවෙන් පැරදුණු පාර්ශවයට නඩු ගාස්තු ගෙවිය යුතුය.

(3) නීතියේ ප්‍රතිපාදන අනුව තීරණ ලබා දිය යුතුය.

(4) විත්තිකරු අධිකරණයේ පෙනී සිටීම අනිවාර්ය නැත.

The National e-Learning Portal for The General Education

30. සේවා සේවක ආරවුල් විසඳීම සඳහා හොඳම ක්‍රමය වන්නේ මින් කුමක් ද?

(1) සාකච්ඡා ක්‍රමය (2) සමථකරණය (3) විනිසීම (4) එකඟත්වයක් ගොඩනැඟීම

31. දේශ සීමා අරගල සඳහා හොඳම උදාහරණය වන්නේ මින් කුමක් ද?

(1) ඊශ්‍රායල පලස්තීන ගැටුම
(2) පකිස්ථානය හා නේපාලය අතර ගැටුම
(3) පකිස්ථානය හා ඉන්දුනීසියාව අතර ගැටුම
(4) පලස්තීනය හා අයර්ලන්තය අතර ගැටුම

32. පහත කරුණුවලින් යුරෝපා සංගමය ඇති කිරීමේ අරමුණු 02 ක් තෝරන්න.

A - මූල්‍ය ගනුදෙනු වඩා ක්‍රමවත් කිරීම.

B - කලාපීය වෙළෙඳාම පුළුල් කිරීම.

C - කලාපීය සහයෝගීතාව ඇති කිරීම.

D - නිර්බාධ වෙළෙඳාම ව්‍යාප්ත කිරීම.

(1) A, B (2) A, C (3) A, D (4) B, D

33. ශ්‍රී ලංකාවේ රාජ්‍ය භාෂා ලෙස පිළිගෙන ඇත්තේ,

(1) සිංහල හා දෙමළ (2) සිංහල හා ඉංග්‍රීසි (3) සිංහල පමණි (4) සිංහල, දෙමළ, ඉංග්‍රීසි

34. ධනවාදී වෙළෙඳපොළ ලක්ෂණ වැඩි වශයෙන් දැකිය හැකි රටවල් වන්නේ මින් කවර ඒවාද?

(1) උතුරු කොරියාව හා දකුණු කොරියාව
(2) ඕස්ට්‍රේලියාව හා දකුණු කොරියාව
(3) කියුබාව හා උතුරු කොරියාව
(4) කියුබාව හා දකුණු කොරියාව

35. " ඇදහිලි, චින්තන ක්‍රම, ව්‍යවහාරික කලා, ජීවන පිළිවෙත්, සිරිත් විරිත්, සම්ප්‍රදායන් හා සමාජීය වශයෙන් සම්මත කරගත් ක්‍රියා කිරීමේ විධි සංස්කෘතිය යි." යනුවෙන් ප්‍රකාශ කළ සමාජ විද්‍යාඥයා වන්නේ,

(1) ටී. බී. ටයිලර් (2) චාර්ල්ස් ඒ. එල්වුඩ් (3) ටී. එච්. ග්‍රීන් (4) ඊ. ටී. හිලර්

36. අන්තර්ජාතික ගැටුම්වල දී අති බිහිසුණු ගැටුම ලෙස සැලකෙන්නේ,

(1) ඉන්දු පාකිස්ථාන යුද්ධයයි
(2) තුර්කිය හා සිරියාව අතර යුද්ධයයි
(3) ඉරාකය හා ඉරානය අතර යුද්ධයයි
(4) දෙවන ලෝක යුද්ධයයි

37. පහත ඒවායින් භාණ්ඩ හා සේවා සඳහා උදාහරණ දැක්වෙන පිළිතුර තෝරන්න.

A - ඛනිජතෙල්

B - පොස්පේට්

C - අධ්‍යාපනය

D - ගොඩනැගිලි

E - දුරකථන

(1) A, C, E (2) B, C, E (3) D, C, B (4) B, A, D

38. මධ්‍යම ආණ්ඩුව හා පළාත් සභාව අතර සම්බන්ධීකරණය භාරව ක්‍රියා කරන්නේ,

(1) ජනාධිපතිවරයායි (2) ආණ්ඩුකාරවරයායි (3) මහඇමතිවරයායි (4) පළාතේ අධ්‍යාපන ඇමතිවරයායි

39. වර්තමාන ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන විශාලතම සංවර්ධන ව්‍යාපෘතියක් වන්නේ,

(1) කොළඹ වරාය ඉදි කිරීමයි.
(2) මහවැලි සංවර්ධන ව්‍යාපෘතිය යි.
(3) නිදහස් වෙළෙඳ කලාප පිහිටුවීමයි.
(4) මොරගහකන්ද ජලාශ සංවර්ධන යෝජනා ක්‍රමයයි.

40. පහත "අ" තීරුවේ සඳහන් ප්‍රකාශ "ආ" තීරුවේ සඳහන් ප්‍රකාශ හා නිවැරදිව ගැලපූ විට අදාළ පිළිතුර ඇතුළත් කාණ්ඩය වන්නේ,

| | අ | | ආ |
|---|---|---|---|
| 01 | බහු පක්ෂ | A | චීනය හා උතුරු කොරියාව |
| 2. | ද්වි පක්ෂ | B | ඉන්දියාව හා ලංකාව |
| 3. | ඒක පක්ෂ | C | බ්‍රිතාන්‍ය හා ඇමෙරිකාව |

(1) A, B, C (2) C, B, A (3) B, C, A (4) B, A, C

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# අවසාන වාර පරීක්ෂණය 2016

**10 ශ්‍රේණිය** **පුරවැසි අධ්‍යාපනය II** **කාලය පැය 02 යි.**

| නම/ විභාග අංකයඃ |
|---|

<u>උපදෙස් :</u>
- පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.
- පළමුවන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

---

01. (i) ආණ්ඩුවේ ප්‍රධාන ආයතන දෙකක් නම් කරන්න.

(ii) රටක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව කටයුතු කිරීමෙන් ලැබෙන වාසි 2 ක් ලියන්න.

(iii) රාජ්‍යයේ ප්‍රධාන ස්වරූප දෙක දක්වන්න.

(iv) ව්‍යවස්ථාදායකයේ කාර්යයන් දෙකක් ලියන්න.

(v) පළාත් සභාවක සංවෘත ලැයිස්තුවට අයත් බලතල හා කාර්යයන් 02 ක් නම් කරන්න.

(vi) පළාත් පාලන ආයතන වර්ග දෙකක් ලියන්න.

(vii) මිනිසාට ලැබිය යුතු ආර්ථික අයිතිවාසිකම් වර්ග දෙකක් ලියන්න.

(viii) ගැටුම් ඇතිවන පාර්ශව දෙකක් නම් කරන්න.

(ix) ගැටුම් වර්ග පුළුල් ලෙස බෙදිය හැකි ප්‍රධාන ක්ෂේත්‍ර දෙක කුමක් ද?

(x) ලෝකයෙහි පවත්නා විවිධ අර්ථක්‍රම වර්ග 2 ක් නම් කරන්න. (ල. 20)

02. (i) ප්‍රජාතන්ත්‍රවාදයේ ප්‍රධාන ස්වරූප දෙක කුමක් ද? (ල. 02)

(ii) ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක තිබිය යුතු අංග ලක්ෂණ තුනක් නම් කරන්න. (ල. 03)

(iii) ප්‍රජාතන්ත්‍රවාදී පාලනයක ඇති වැදගත් කම පිළිබඳ කරුනු තුනක් දක්වා ඉන් එකක් විස්තර කරන්න. (ල. 05)

03. (i) නූතන රාජ්‍යවල බලය බෙදීමට බලපෑ හේතු දෙකක් ලියන්න. (ල. 02)

(ii) සන්ධිය රාජ්‍යයක දැකිය හැකි ලක්ෂණ 03 ක් නම් කරන්න. (ල. 03)

(iii) සන්ධීය රාජ්‍යයක සාර්ථක පැවැත්මට තිබිය යුතු ගුණාංග 03 ක් දක්වා ඉන් එකක් විස්තර කරන්න. (ල. 05)

04. (i) බහු සංස්කෘතික ජන සමාජයක තිබිය යුතු ලක්ෂණ 02 ක් ලියන්න. (ල. 02)

(ii) ශ්‍රී ලංකාව බහු සංස්කෘතික ජන සමාජයක් වීම සඳහා බලපෑ හේතු 03 ක් නම් කරන්න. (ල. 03)

(iii) බහු සංස්කෘතික ජන සමාජයක එක්සත්ව කටයුතු කිරීමෙන් ලැබෙන වාසි 03 ක් දක්වා ඉන් එකක් පැහැදිලි කරන්න. (ල. 05)

05. (i) පුද්ගල හා සමාජ පූර්ණ සංවර්ධනය සඳහා සලකා බැලිය යුතු අංශ දෙකක් ලියන්න. (ල. 02)

(ii) තිරසාර සංවර්ධනයේ දී සැලකිය යුතු මූලික කරුණු තුනක් ලියන්න. (ල. 03)

(iii) දැනට සිදුවෙන සංවර්ධන ක්‍රියා නිසා ලංකාවට අත් වී ඇති වාසි 03 ක් දක්වා ඉන් එකක් විස්තර කරන්න. (ල. 05)

06. (i) ගෝලීයකරණය තුළ දක්නට ලැබෙන විශේෂ ලක්ෂණ දෙකක් ලියන්න. (ල. 02)

(ii) ගෝලීයකරණය නිසා ලෝක ආර්ථිකය තුළ දක්නට ලැබෙන ලක්ෂණ තුනක් නම් කරන්න. (ල. 03)

(iii) ගෝලීයකරණය ශ්‍රී ලංකාවට කරන සෘණාත්මක බලපෑම් 03 ක් දක්වා ඉන් එකක් විස්තර කරන්න. (ල. 05)

07. (i) සමාජ ආර්ථික තත්වය මත ගැටුම් ඇතිවන අවස්ථා දෙකක් ලියන්න. (ල. 02)

(ii) ගැටුම් නිරාකරණය කිරීමේ ක්‍රම 03 ක් නම් කරන්න. (ල. 03)

(iii) ගැටුම් නිරාකරණය කර ගැනීමෙන් ඇතිවන වාසි 03 ක් දක්වා ඉන් එකක් විස්තර කරන්න. (ල. 05)

The National e-Learning Portal for The General Education

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව** **අවසාන වාර පරීක්ෂණය 2016**

**10 ශ්‍රේණිය** **පුරවැසි අධ්‍යාපනය**

## පිළිතුරු පත්‍රය - I කොටස

| | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 01. | (3) | 02 | (1) | 03 | (2) | 04 | (1) | 05 | (3) | 06 | (4) | 07 | (2) | 08 | (1) |
| 09 | (3) | 10 | (4) | 11 | (2) | 12 | (1) | 13 | (2) | 14 | (3) | 15 | (2) | 16 | (2) |
| 17 | (4) | 18 | (4) | 19 | (3) | 20 | (4) | 21 | (2) | 22 | (3) | 23 | (4) | 24 | (3) |
| 25 | (4) | 26 | (3) | 27 | (1) | 28 | (4) | 29 | (3) | 30 | (4) | 31 | (1) | 32 | (3) |
| 33 | (1) | 34 | (2) | 35 | (4) | 36 | (4) | 37 | (1) | 38 | (2) | 39 | (4) | 40 | (3) |

## II කොටස

01. (i) ව්‍යවස්ථාදායකය, විධායකය, අධිකරණය (ii) * පාලනයේ ක්‍රමවත් බව හා ස්ථාවර බව ආරක්ෂා වීම / * පාලකයන්ගේ අත්තනෝමතික ක්‍රියා වැලැක්වීම / * අධිකරණයේ ස්වාධීනත්වය සුරක්ෂිත වීම / * මූලික අයිතිවාසිකම් සුරක්ෂිත වීම / * නීතියේ රැකවරණය සැමට සමාන විම ආදී........ (පෙළපොත පිටුව 14) (iii) ඒකීය රාජ්‍ය, සංඝීය රාජ්‍ය (iv) නීති පැනවීම, මුදල් පාලනය, විධායකය පාලනය (v) පළාත්සභා ලැයිස්තුව, සංවෘත ලැයිස්තුව, සමගාමී ලැයිස්තුව (vi) මහනගරසභා, නගරසභා, ප්‍රාදේශීය සභා (vii) ● තමන් කැමති නිත්‍යානුකූල වෘත්තියක හෝ ව්‍යාපාරයක නිරත වීම. ● වෘත්තීය සමිති පිහිටුවා ගැනීම හා ක්‍රියාත්මක කිරීම. ● ආදායම් බෙදීයාමේ විෂමතාව අවම කිරීමට පියවර ගැනීම. ● යටිතල පහසුකම් සංවර්ධනය කිරීම. (viii) ● පුද්ගලයා තුළ / ● පුද්ගලයින් අතර / ● ජන කණ්ඩායම් අතර / ● රටවල් අතර (ix) ධනවාදී අර්ථක්‍රමය, සමාජවාදී අර්ථ ක්‍රමය, මිශ්‍ර අර්ථ ක්‍රමය (x) අභ්‍යන්තර ගැටුම්, අන්තර්ජාතික ගැටුම් (ල. 20)

02. (i) (a) ඍජු ප්‍රජාතන්ත්‍රවාදය (b) වක්‍ර ප්‍රජාතන්ත්‍රවාදය (ල.02) (ii) ⋆ නිදහස් හා සාධාරණ මැතිවරණ / ⋆ සර්වජන ඡන්ද බලයෙන් පාලකයන් තෝරා ගැනීම / ⋆ තරඟකාරී පක්ෂ ක්‍රමය. / ⋆ ඡන්ද කොට්ඨාශ ක්‍රමය / ⋆ ආණ්ඩු පක්ෂයක් හා විරුද්ධ පක්ෂයක් පැවතීම. (ල. 03) (පෙළපොත 6 16 පිටු) (iii) ● සමාන අයිතිවාසිකම් හිමිවීම / ● පුද්ගල හැකියා හා දක්ෂතා සංවර්ධනයට ඉඩ ප්‍රස්ථාව ලැබීම. / ● පුරවැසියන්ට පාලනයට සහභාගි වීමට අවස්ථාව උදාවීම. / ● මානව සංවර්ධනයට ප්‍රමුඛතාව හිමිවීම. / ● සාමකාමී සමාජයක් ගොඩනැගීමේ පදනම වැටීම. / ● සමාජ සුභසාධනය (ල. 05 (කරුණු 3කට ලකුණු 03 1 ක් විස්තර කර තිබීමට ල. 02)

03. (i) ● විවිධත්වය තුළින් එක්සත් බව ගොඩනගා ගැනීම / ● රාජ්‍යයේ විශාලත්වය නිසා පාලන කටයුතු සිදු කිරීමේ අපහසුව. / ● ජාතික ආරක්ෂාව තහවුරු කර ගැනීමට (ල.02) (ii) ⋆ ලිඛිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් තිබීම. / ⋆ මධ්‍යම හා ප්‍රාන්ත ආණ්ඩු සතු බලතල ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් බෙදා දක්වා තිබීම. ⋆ ව්‍යවස්ථාව අර්ථ නිරූපණය ඉහළ අධිකරණ වලට පැවරීම. / ⋆ දෙවන මණ්ඩලයක් ක්‍රියාත්මක වීම. (ල. 03) (iii) * පවතින ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව කටයුතු කිරීම. / * සියලු ජන කොටස් පොදු හැඟීමෙන් කටයුතු කිරීම / * මූල්‍ය සම්පත් බෙදීමේදී ප්‍රාන්ත ආණ්ඩු වෙත සාධාරණව බෙදා හැරීම. (කරුණු 3කට ලකුණු 03 1 ක් විස්තර කර තිබීමට ල. 02) (ල. 05)

04. (i) විවිධ ජනවර්ග, ආගම්, භාෂා, සංස්කෘතීන්, සිරිත් විරිත්, ඇඟයීම් පද්ධති, ආචාරධර්ම ආදිය විවිධ වීම. (ල. 02) (ii) පිහිටීම සංක්‍රමන, ආක්‍රමණ, විවිධ ජාතීන් වෙළඳාම සඳහා පැමිණීම, ශ්‍රමිකයන් ගෙන්වා ගැනීම. (iii) * ගැටුම් අඩුවීම, ජාතික සමගිය වර්ධනය අන්‍යෝන්‍ය සුහදත්වය වර්ධනය, මිනිස් නිදහස හා ප්‍රජාතන්ත්‍රවාදය තහවුරු වීම, / ආදී........ (පෙළපොත 67 පිටුව) (ල. 05) (කරුණු 3කට ලකුණු 03 1 ක් විස්තර කර තිබීමට ල. 02)

05. (i) ආර්ථික සංවර්ධනය, පුද්ගල සංවර්ධනය සංස්කෘතික සංවර්ධනය, සමාජ සංවර්ධනය, සදාචාර සංවර්ධනය, තිරසාර සංවර්ධනය. / (ii) * මූලික අවශ්‍යතා තෘප්තිමත් කර ගැනීම / * අනාගත පරම්පරාව සමඟ ඒකමතික වීම, / * ජනතා සහභාගිත්වය ඇතිකර ගැනීම. / * ස්වභාවික සම්පත් සංරක්ෂණය / * පරිසරය ආරක්ෂා කර ගැනීම. / * සමාජ සුරක්ෂිත භාවය / *අන්‍ය සංස්කෘතීන්ව මාරු කිරීම. (iii) * සේවා නියුක්තිය ඉහළයාම. / ජනතාවගේ ජීවන මට්ටම උසස් වීම. / * ප්‍රාදේශීය සංවර්ධනය වේගවත් වීම. / * යටිතල පහසුකම් වර්ධනය වීම. / නව රැකියා අවස්ථා පුළුල් වීම. ආදී ලෙස මින් එකක් විස්තර කිරීම (පෙළපොත පිටු අංක 85) (කරුණු 3කට ලකුණු 03 1 ක් විස්තර කර තිබීමට ල. 02)

06. (i) ⋆ වැඩලෝකය පුලුල් වීම / ⋆ ගෝලීය වෙළඳපල පුලුල් වීම / ⋆ ලෝකයේ ඕනෑම රටක ජීවත්වීමට හැකි වීම. / ⋆ තම දක්ෂතා හැකියා අනුව වෙනත් රටකට සේවය කිරීමට හැකි වීම. / ⋆ අඩුමිලට ශ්‍රමය ලබාගත හැකි රටකට කර්මාන්ත සංක්‍රමණය වීම. (ii) ● බහුජාතික සමාගම් බිහිවීම. / ● දේශීය මුදල් විදේශවලට ඇදී යාම / ● කලාපීය සහයෝගිතා සංවිධාන බිහිවීම / ● ශ්‍රම හා ප්‍රාග්ධන සංචලතා ඇතිවීම. (පෙළපොත පිටු අංක 88) (iii) * බුද්ධිගලනය වේගවත් වීම / * දේශීය සම්පත් සූරා කෑම / * සංවර්ධිත රටවල බලපෑම් ඉහළයාම / * විදේශීය ණය හා ආධාර මත යැපීමට සිදුවීම. * දේශීය යැපුම් ආර්ථික රටාව විනාශ වීම. (පෙළපොත 91 පිටුව) (කරුණු 3කට ලකුණු 03 1 ක් විස්තර කර තිබීමට ල. 02)

07. (i) දරිද්‍රතාව, වෙළඳපළ, සම්පත් (ii) * සාකච්ඡා කිරීම, මැදිහත්කරණය සහමන්ත්‍රණය හා කේවල් කිරීම, සමතකරණය බේරුම්කරණය විනිසීම, උපදේශණය , එකඟත්වයක් ගොඩනගා ගැනීම, (iii) ජීවිත හානි වළකීම, දේපල හානි වැලකීම සම්පත් නාස්තිය වැලකීම, අයිතිවාසිකම් ආරක්ෂා වීම ආත්ම ගරුත්වය සුරැකීම.......... (පෙළපොත107 පිටුව) (කරුණු 3කට ලකුණු 03 1 ක් විස්තර කර තිබීමට ල. 02)